**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය**

**පුරප්පාඩු**

මෙම විශ්වවිද්‍යාලයේ සංගීත පීඨයේ උත්තර භාරතීය සංගීත අධ්‍යයනාංශයේ තාවකාලික කථිකාචාර්ය තනතුරුවලට සුදුස්සන් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. තනතුර :-තාවකාලික කථිකාචාර්ය

02. විෂයය :- **1. උත්තර භාරතීය සංගීතය - වාදනය - බොක්ස් ගිටාර්**

**2. උත්තර භාරතීය සංගීතය - වාදනය - හවායන් ගිටාර්**

**මූලික සුදුසුකම්**

අදාළ විෂය සඳහා ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධිය - සංගීත ප්‍රථම පෙළ හෝ දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සහිතව සමත්ව තිබීම හෝ වෙනත් පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂයයන් සඳහා ප්‍රථම පෙළ හෝ දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සහිතව සමත්ව තිබීම.

**විශේෂ සුදුසුකම්**

1. බඳවා ගන්නා තනතුරට අදාළ විෂය සඳහා“A⁻ හෝ ඊට ඉහළ” සාමාර්ථයක් ලබා තිබීම.
2. මෙම විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දෙකකට හෝ ඊට වැඩි කාලයක ඉගැන්වීමේ පළපුරුද්දක් ලබා තිබීම.

**අමතර සුදුසුකම්**

පරිගණක තාක්‍ෂණය පිළිබඳ හැකියාව සහ අදාළ විෂයය ඉගැන්වීම සඳහා තාක්ෂණය යොදා ගැනීමේ හැකියාවක් තිබීම.

**වැටුප් පරිමාණය :- U-AC-2 රු. 49,860/- (මාසික) (ස්ථාවර)**

**අයදුම්කරුවන් සඳහා උපදෙස්:-**

01. අපේක්‍ෂකයින් විසින් සකස් කරන ලද ජීවදත්ත පත්‍රිකාවක් **2024.12.16** දින හෝ ඊට ප්‍රථම සහකාර ලේඛකාධිකාරී, සංගීත පීඨය, නො. 21, ඇල්බට් චන්ද්‍රවංකය, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සහ විෂය පැහැදිලිව සඳහන් කළ යුතුය.

02. ලියාපදිංචි තැපෑලෙන් අයදුම්පත් එවීමේ දී අයදුම්පත්‍රයෙහි සඳහන් කරුණු සනාථ කෙරෙන අදාළ සියළු සහතිකපත්‍ර වල සහතික කළ ඡායා පිටපත් අයදුම්පත සමග අමුණා එවිය යුතු අතර, අදාළ සහතිකපත්‍ර පිටපත් අමුණා නොමැති අයදුම්පත් අසම්පූර්ණ ලෙස සැලකෙන අතර ඇගයීමට භාජනය නොවනු ඇත.

03. අසම්පූර්ණ, අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති සහ නියමිත දිනයන්ට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේඛකාධිකාරී,
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය